විෂයමාලා න්‍යාය හා භාවිතය -
දේශනය - (10)
W.A. විමලසේන සර් - 2022. 01. 09
(8.30 – 11.30)

# විෂයමාලා ආකෘති - II



- අරමුණු ආකෘති
  - රේඛීය ආකෘති (ටයිලර් ආකෘතිය)
  - චක්‍රීය ආකෘති (විලර් ආකෘතිය)


- අරමුණු නොවන ආකෘති
  - ගතික ආකෘති (වෝල්කර් ආකෘතිය)
  - සංස්කෘතික විශ්ලේෂණ ආකෘති (ස්කිලිබෙක් ආකෘතිය)

## විෂයමාලා ආකෘති

විෂය මාලා සංවර්ධනයේදී විෂයමාලාවක් සංවිධානය කිරීම සාර්ථක කර ගැනීම සඳහා එයට ඉවහල් කර ගත හැකි (පදනම් කරගත හැකි) ආකෘති කිහිපයක් හඳුන්වා දී ඇත. එම ආකෘති අතර අරමුණු ආකෘති සහ අරමුණු නොවන ආකෘති වශයෙන් කොටස් දෙකකට බෙදා වෙන් කළ හැක. මීට කලින් සඳහන් කර ඇති ආකෘති අරමුණු ආකෘති වේ. (ටයිලර් සහ විලර්ගේ ආකෘති). අරමුණු ආකෘති වලදී අරමුණු මතම පදනම් වේ. අරමුණු නොවන ආකෘති වලදී එය වෙනස් වේ. පහතින් දැක්වෙන්නේ අරමුණු ආකෘති පිළිබඳ උදාහරණ කිහිපයකි. ඒ අනුව අරමුණු නොවන ආකෘති පිළිබඳව විග්‍රහ කර බලමු.

## අරමුණු නොවන ආකෘති (ක්‍රියාවලි ආකෘති)

### ජෝන් එෆ්. කර්ගේ ආකෘතිය



ඉහතින් දක්වා ඇත්තේ ජේ. එෆ්. කර් නැමැත්තා විසින් 1969 දී ඉදිරිපත් කරන ලද විෂයමාලා සංවර්ධන ආකෘතියයි. ඔහු ඉදිරිපත් කරන මෙම ආකෘතිය ටයිලර් සහ විලර් වැනි ආකෘති වලට වඩා සංකීර්ණව සහ විස්තරාත්මකව විග්‍රහ නරයි. මෙහිදී කර් වැදගත්ම අංශ 04 ක් ඉදිරිපත් කරන අතර ඒවා නම්,


1. අරමුණු
2. දැනුම
3. ඉගෙනුම් අද්දැකීම්
4. ඇගයීම්

ලෙස නම් කර ඇත. මේවා විෂයමාලාව සම්බන්ධ සාධනීය ලක්ෂණයන් වන අතර ප්‍රතිඵල කෙරෙහිද අවධානය යොමුකර ඇත.

කර්ගේ ආකෘතියේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ අරමුණු ප්‍රධාන ක්ෂේත්‍ර 03 කට බෙදා වෙන්කිරීමයි. එමෙන්ම විෂයන් තෝරා ගැනීමේදී සහ ඉගෙනීමේදී ශිෂ්‍යයාට වැදගත් වන සංකල්ප හා මූලධර්ම පිළිබඳවද අවබෝධයක් ලබා දේ. එපමණක්ද නොව විෂය අන්තර්ගතය තුළින් සමෝදානික අනුපිළිවෙළ පුන පුනා ඉදිරිපත් කිරීමේ වැදගත්කම අවධාරණය කරයි.

මෙම ආකෘතිය මගින් ප්‍රායෝගික අද්දැකීම්ද අවධාරණය කරයි. එය පන්ති කාමරයට පමණක් සීමා වන්නේද නැත. ඉගෙනුම් අද්දැකීම් ලබා දීමේදී ඉගැන්වීමේ ක්‍රමය, විෂය කරුණු, සූදානම, පෞද්ගලික විවිධතා, ගුරු ශිෂ්‍ය අන්තර් සම්බන්ධතා, පාසල් ප්‍රජාව හා සමාජ අවස්ථා ඉතා වැදගත් වේ. එපණක්ද නොව කර්ගේ ආකෘතිය මගින් ශිෂ්‍යයන්ගේ අනාවරණ (ශිෂ්‍යන් තුළ මේ අවස්ථාවේ පවතින මට්ටම), නිරීක්ෂණ, ගවේෂණ වැනි චින්තන ශක්තීන් වර්ධනය කිරීම කෙරෙහිද විෂයමාලා සංවර්ධනයේදී මෙම ආකෘතිය මගින් ඔහු පෙන්වා දෙයි.

## ස්කිල්බෙක්ගේ ආකෘතිය (සංස්කෘතික විශ්ලේෂණ ආකෘතිය)




ඉහතින් දක්වා ඇත්තේ ස්කිල්බෙක් නැමැත්තා විසින් 1939 දී විෂයමාලාව සංවර්ධනය සදහා ඉදිරිපත් කළ ආකෘතියකි. මෙම ආකෘතියද අනෙක් විෂයමාලා සංවර්ධන ආකෘති වලට වඩා වෙනස් මගක් ගන්නා ආකෘතියක් වේ. ඔහු ආකෘතිය සකස් කිරීමේදී සංස්කෘතික රාමුවක් තුළ විෂය මාලාව නිර්මාණය හා සංවර්ධනය නිරූපණය කිරීමට උත්සාහ කරයි. එමෙන්ම සංස්කෘතික වටිනාකම් සහ අර්ථකථන සංකේතාත්මකව අවබෝධයක් ලබාදීම තුළින් ගුරු ශිෂ්‍ය අද්දැකීම් ලබා දීමට පහසු වන බව පැහැදිළි කරයි. ස්කිල්බෙග්ගේ ආකෘතිය අනෙකුත් ආකෘතීන්ගෙන් වෙනස් වන්නේ ළමයින්ගේ සංස්කෘතික ලක්ෂණ සමග ඔවුන්ගේ සිතුවිලි සහ ක්‍රියාකාරකම් බද්ධ කිරීමට පියවර ගෙන තිබෙන නිසාය.

මේ නිසා මෙම ආකෘතිය සංස්කෘතික විශ්ලේෂණ ආකෘතියක් ලෙසද හදුන්වා දී ඇත. ස්කිල්බෙක්ගේ ආකෘතියේ ප්‍රධාන කරුණු 05 ක් ඉදිරිපත් කරයි. ඒ අනුව,

1. තත්ව විශ්ලේෂණය
2. අරමුණ
3. සැලසුම (වැඩසටහන ගොඩනැංවීම)

4. අර්ථ නිරූපණය කිරීම හා ක්‍රියාත්මක කිරීම
5. ඇගයීම (අධීක්ෂණය, ප්‍රතිපෝෂණය, තක්සේරුව, ප්‍රතිසංස්කරණය)

ස්කිල්බෙක්ගේ විෂයමාලා ආකෘතියේ ආරම්භය වෙනත් සාම්ප්‍රදායික ආකෘති මෙන් පරමාර්ථ වලින් තීරණය නොවේ. ඔහු පළමුවෙන්ම තත්ව විශ්ලේෂණයක් සිදු කරයි. තත්ව විශ්ලේෂණය තුළදී පහත කරුණු පිළිබඳව අවධාරණය කළ යුතු බව පෙන්වා දෙයි. ඒ අනුව,

- දෙමාපියන්ගේ අපේක්ෂා,
- ප්‍රජාවගේ අපේක්ෂා
- උපකල්පන
- වටිනාකම්
- සමාජ සංස්කෘතික වෙනස්කම් හා අපේක්ෂාවන්
- අධ්‍යාපන පද්ධතියේ අවශ්‍යතා (ප්‍රතිපත්ති, විභාග, පළාත්/ කලාප සහ ඒවායේ ක්‍රියාත්මක ස්වභාවය, ඉගැන්විය යුතු විෂය කරුණු, විෂය කරුණු වල ස්වභාවය, විෂයමාලා ව්‍යාපෘති, ගුරු උපදේශන සේවය, ගුරු පුහුණු ආයතන)
- පාසලේ සම්පත් (නිදසුන් - ගුරුවරු)

යනාදියයි.


ඉහත ආකාරයට විෂයමාලා සංවර්ධනයේදී අවශ්‍යවන භෞතික පසුබිම පළමුවෙන්ම විශ්ලේෂණය කර මීළගට පරමාර්ථ සහ අරමුණු තීරණය කිරීම සිදුකරයි.

මීළගට විෂයමාලාව ක්‍රියාත්මක කිරීම නැතහොත් සැකසීම සිදුකරනුයේ සමාජ විද්‍යාත්මක දාර්ශනික සංකල්ප අනුව සාකච්ඡාවක් මගින් විෂයමාලා කුසලතා ලබාදීම සඳහා යොමු කිරීමයි. හතරවන අධියරේදී ක්‍රියාත්මක කිරීමේදී ස්කිල්බෙක් සඳහන් කරන්නේ පහත කරුණු පිළිබඳව වැඩි අවධානයක් යොමු කළ යුතු බවයි. එනම් විෂයමාලා සංකල්ප සැලසුම් ක්‍රියාත්මක කිරීම, වර්තමාන සංජානන ස්වභාවය සහ ගුරුවරයා හා ශිෂ්‍යයන් අතර අන්තර් ක්‍රියාවලියේ ස්වභාවය, අභිප්‍රේරණය යන කරුණු ගැන අවධානය යොමුකළ යුතු වේ. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාත්මක වීමේදී කුමන අභියෝග වලට පත්වේද යන්න ක්‍රියාත්මක වීමේදී සොයාබැලිය යුතු බව මෙම අවධියේදී පැහැදිළි කරයි.

අවසානයේදී ඇගයීම් හා තොරතුරු පදනම් කර ගනිමින් ප්‍රතිපෝෂණය හා අනාගතය පිළිබඳව තක්සේරුවක් සිදුවේ. එපමණක්ද නොව විෂය ප්‍රතිසංවිධානය සහ ආකෘතිය තුළ කළයුතු මෙහෙයවීම් වෙනස්කම් සම්බන්ධයෙන් සංවර්ධනාත්මක ක්‍රියාමාර්ග ලබා ගැනීමට පදනමක්ද වේ.

## මොරිට්ස් ජොන්සන්ගේ ආකෘතිය

විෂයමාලා සංවර්ධනය සහ උපදේශනය ක්‍රියාවලි දෙකක් ලෙස මෙමගින් පෙන්වා දී ඇත. විෂයමාලාව විෂයමාලා සංවර්ධනයේ නිමැවුම ලෙසත් උපදේශනයේ යෙදවුම් ලෙසත් පෙන්වා දී ඇත. උපදේශනයේ ඵලය ඉගෙනුම් ප්‍රතිඵලය විෂයමාලා සංවර්ධන කාර්යය දෙස ක්‍රියාවලියක් ලෙස බැලීමත් එය එකිනෙකට සම්බන්ධ පද්ධති දෙකක් ලෙස වෙන් කර දැක්වීමත් මෙහි විශේෂ ලක්ෂණයකි.





ඉහත දක්වා ඇති ආකෘතිය මගින් විෂයමාලා සංවර්ධනයේදී ප්‍රධාන පද්ධති 02 ක් පිළිබඳව අවධාරණය කරයි. ඒ අනුව,

1. විෂයමාලා සංවර්ධනය
2. උපදේශනය

මෙම ආකෘතියේදී විෂයමාලා සංවර්ධනය හා උපදේශනය අතර මනා සම්බන්ධීකරණයක් ගොඩනැංවීම තුළින් අපේක්ෂිත ඉගෙනුම්ඵල ලබා ගැනීම මෙම ආකෘතියේ විශේෂ ලක්ෂණයක් වේ. මෙහිදී උපදේශන සැලැස්මක් ගැනද අවධාරණය කරයි. මෙහිදී විෂයමාලා සංවර්ධනයේදී සිදුවන්නේද උපදේශන ක්‍රියාවලියක් නිසා උපදේශනාත්මක සැලැස්ම සාර්ථක වීම මගින් විෂයමාලාවේ අවසන් ඉගෙනුම්ඵල ලබා ගැනීමට හැකියාව ලැබේ. එනම් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේදී උපදේශනාත්මක ක්‍රියාවලිය මනා සැලසුම් සහගත වීම විෂයමාලා සංවර්ධනයේදී අපට මනාව පැහැදිලි වේ.

## ඩෙනිස් ලෝටන්ගේ ආකෘතිය

විෂයමාලා සංවර්ධනයේදී වඩා වැදගත් වන්නේ සංස්කෘතිය බවත් සංස්කෘතියෙන් තෝරාගත් දේ මත විෂයමාලාව සංවර්ධනය කළ යුතු බවත් තවත් සමහරු පෙන්වා දී ඇත. මෙබදු ආකෘතියක් ඩෙනිස් ලෝටන් 1975 දී ඉදිරිපත් කර ඇත.




ඉහත ආකෘතිය මගින් විශේෂ ලක්ෂණයක් පෙන්නුම් කර ඇත. එනම් කාර්යය මණ්ඩල හා පාසල් කාලසටහන පිළිබද අවධානයට ලක් කිරීමයි. මේ අනුව ඩෙනිස් ලෝටන්ගේ ආකෘතිය සංස්කෘතියක් මගින් තෝරාගත් සංස්කෘතික කේන්ද්‍රීය විෂයමාලා ආකෘතියක් ලෙස පෙන්වා දිය හැක.

අරමුණු නොවන ආකෘතියක් පිළිබදව වෙනස්කම් ඔබගේ වචනයෙන් පැහැදිළි කරන්න

<u>ප්‍රශ්නය</u>

1. අරමුණු නොවන ආකෘතියක් පිළිබදව වෙනස්කම් ඔබගේ වචනයෙන් පැහැදිළි කරන්න
2. ආකෘතියක් යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද ?
3. ආකෘති තුනක් පිළිබදව වෙනස්කම් ලියන්න.